අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
**PRIME MINISTER'S OFFICE**

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

12 SEP 2017

මගේ අංකය - PMO/10/07/AUG/131/2017
දිනය 2017.08.28

**ලේකම්**
**ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

**ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්**
**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්**
**වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

තැපැල් අංශය 06 SEP 2017

**<u>දුම්කොළ ගොවීන්ට උද්ගතව ඇති ගැටළු පිළිබඳ සාකච්ඡාව</u>**

01. දුම්කොළ වගාවට උද්ගතවී ඇති ගැටළු නිරාකරණය කිරීමට මැදිහත් වන ලෙස සමස්ත ලංකා සිගරට් දුම් උදුන් හිමි සංගමය විසින් ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් කරනු ලැබූ ඉල්ලීමකට අනුව සමස්ත ලංකා සිගරට් දුම් උදුන් හිමි සංගමය සමඟ සාකච්ඡාවක් 2017.08.16 වන දින පෙ.ව 10.00 ට අග්‍රාමාත්‍ය කාර්යාලයීය මහජන සම්බන්ධතා අංශයේදී පැවැත්වූ අතර රාජ්‍ය අනුග්‍රහය මත ආර්ථික බෝගයක් ලෙස හඳුන්වා දෙන ලද දුම්කොළ වගාවට අදාලව මේ වන විට උද්ගතව තිබෙන ගැටළු සම්බන්ධයෙන් එහිදී සාකච්ඡා විය.

02. දුම්කොළ වගාව, ජලය හිඟ කුඹුරු ඉඩම් ඇතුළු ආන්තික වගා භූමි සඳහා විකල්පයක් ලෙස රජය විසින් පිළිගෙන ඇති නමුත් දුම්කොළ ගොවීන් විසින් තම වගාවන් සඳහා යොදාගන්නා වී වගාව හෝ ක්ෂේත්‍ර බෝග වැවීම අවධානම් ආන්තික වගා බිම් සම්බන්ධයෙන් අදාල ප්‍රදේශයන්හි ප්‍රාදේශීය ලේකම්වරුන්, ගොවිජන සංවර්ධන නිලධාරීන්, කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිළධාරීන් විසින් බාධා හා බලපෑම් එල්ල කරන බවත් වාරිමාර්ග ආශ්‍රිත අප ජලය පොම්ප කර වගා කටයුතු සඳහා යොදාගැනීම සම්බන්ධයෙන් වාරි මාර්ග ඉංජිනේරුවරුන්ගෙන් බාධා හා බලපෑම් එල්ල වන බවත් අදාල සාකච්ඡාවේදී සහභාගී වූ නියෝජිතයන් විසින් සඳහන් කරන ලදි.

03. පවත්නා නීතිමය තත්වය යටතේ <u>දුම්කොළ වගාව තහනම් වගාවක් නොවන බැවින් ද 300,000 ට ආසන්න යැපෙන්නන් පිරිසකින් සමන්විත, රැකියා අවස්ථා 60,000ක් පමණ උත්පාදනය කර ඇති</u> දුම්කොළ කර්මාන්තය විසින් රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන බැවින් ද විකල්ප වගාවන් සහ සාධාරණ හානි පූරණයක් ලබා දීමට නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ගොවීන් ඉන් මුදවන තෙක් ඔවුන් සිය ජීවන වෘත්තියේ නියැලිය යුතු බවත් රජය විසින් පිළිගෙන ඇති බැවින් ද <u>මෙහි, තිබෙන මෙම කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කොට දුම්කොළ වගාවට අත්තනෝමතික අයුරින් බලපෑම් නොකරන</u> මෙන් අදාල අංශ හා නිලධාරීන් දැනුවත් කරන මෙන් යෝජනා කරමි.

තැපැල් අංශය 19 SEP 2017 ස්වදේශ කටයුතු

ජේ දඩල්ලගේ
උපදේශක (මහජන සම්බන්ධතා)
අග්‍රාමාත්‍ය කාර්යාලය

පිටපත් :

1. අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානී හා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමා
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. සභාපති - සමස්ත ලංකා සිගරට් දුම් උදුන් හිමි සංගමය

තැපැල් අංශය 09 SEP 2017

දුරකථන / தொலைபேசி / Telephones: 2575317 - 18, 2370737 - 38
ෆැක්ස් / தொலைநகல் / Fax: 2575454, 2575310, 2574713
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: pmo@pm.gov.lk, pmo@pmoffice.gov.lk